# NEWSLETTER

# USJP-PALI BUDDHIST

## DPBS-USJP - 2022

Prosper Lives through Learning

**Department of Pali and Buddhist Studies**
**University of Sri Jayewardenepura.**

### HISTORY OF THE DEPARTMENT

The Department of Pali and Buddhist Studies represents one of the oldest Departments of the University of Sri Jayewardenepura. It was originally formed in 1959 under the name of Vidyodaya University of Sri Lanka. The founder of the University, the Most Venerable Welivitiye Sri Soratha Nayaka Thera had the objective of making the University a center of learning on Buddhist Philosophy and Buddhist Civilization. The Department is proud to continue this tradition and provide opportunities for students to learn major areas related to Buddhism - Pali Language and Literature Buddhist Civilization, Buddhist Philosophy, Buddhist Heritage and Tourism.

**Mission**

To produce scholars endowed with sharp acumen with superb commandas and ability to contribute positively their relevant field of studies at local and global levels.



**Appointment of New Head**

Venerable Professor Elamaldeniye Sarananda has been appointed as new head of the Department from 1st of June 2022.

## Message from the Head of the Department

The Department of Pali and Buddhist Studies represents one of the oldest Departments of Study in the University of Sri Jayewardenepura, originally formed in 1959 under the name of Vidyodaya University of Sri Lanka. The founder of the University, the Most Venerable Welivitiye Sri Soratha Nayaka Thera had the objective of making the University a center of learning on Buddhist Philosophy and Buddhist Civilization. The Department is proud to continue this tradition and provide opportunities for students to learn major areas related to Buddhism - Pali Language, Buddhist Civilization and Buddhist Philosophy.

**Ven. Prof. Elamaldeniye Sarananda**

## Chinese Language Power'22 汉语 力'2

The undergraduates of the Buddhist Heritage and Tourism Degree program, Faculty of Humanities and Social Sciences organized "Chinese Language Power'22 汉语 力 '22". The workshop was held on the 06th of September 2022 at Sumangala Auditorium. It aims to enhance the Chinese knowledge and industrial knowledge of students. The resource persons were the President of the Chinese Language and Culture Centre and Lecturer Ven. Sandamadulle Sumanasara, Mrs. Zenia Liu Senior Lecturer, NSBM Green University, Lecturer of Chinese Language and Culture Centre Ms. Xi Jing, Mr.Lahiru Weerawardhana, Managing Director of Travel Trend Leisure (TTL). The chief guest for the events was Professor Shirantha Heenkenda, Dean Faculty of Humanities and Social Sciences. Ven. Professor Elamaldeniye Sarananda, Head of the Department, Professor Dunesh Gunathilaka, Coordinator of the Buddhist Heritage and Tourism Degree Program, and other lecturers participated in this workshop.

## The Diplomas Conducted by the Department

- **Diploma in Buddhist Studies**
- **Diploma in Buddhist Counselling**
- **Diploma in Chenese**
- **Diploma in Tradition of Buddhist Education and Early Childhood Deveopment.**
- **Diploma in Pali**

## නවීකරණය කරන ලද ‘මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ශාලාව’

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ‘මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ශාලාව’ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨ AHEAD - ELTA ELSE - DP - GRANT ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරන ලදි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතාගේ මග පෙන්වීම යටතේ පැරණි ශාලාව සුහුරු පන්ති කාමරයක් (Smart class room) ලෙස නවීකරණය කිරීමට හැකියාව උදාවිය.











## Degree Programs Offered by the Department

- Pali
- Buddhist Civilization
- Buddhist Philosophy
- Buddhist Heritage and Tourism

### බෞද්ධ අධ්‍යයන සංසදය පිහිටුවීම

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ බෞද්ධ අධ්‍යයන සංසදය පිහිටුවන ලදි. අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය එළමල්දෙණියේ සාරානන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් අධ්‍යයනාංශය යටතේ ඇති සියලු විෂයන්හී ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ගේ හා ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනාගේ සහභාගිත්වයෙන් විද්‍යාපීඨ ශ්‍රවනාගාර ශාලාවේ දී පැවැත්විණි.








# Academic staff of the Department



**Ven. Prof. Elamaldeniye Sarananda,**
Professor in Buddhist Civilization
BA(Hons), MA (USJP), Ph.D. (U.S.A),
email: esarananda@sjp.ac.lk
Office: +9411- 2758305,
mobile: +94715440203
Residence: +94112731021



**Ven. Prof. Magammana Paññananda**
Chair Professor in Buddhist Civilization
BA (Hons) (USJ); MA (Kelaniya);
PGD in Education (Colombo);
PhD (Delhi)
Email: pmagammana@gmail.com



**Ven. Prof. Medagoda Abhayatissa**
Professor in Pali
BA (Hons); MA, MPhil (Kelaniya); Ph.D. (Delhi)
Email: abayatissa@yahoo.com
Office: 011-2758305



**Prof. M. D. D. I. Gunathilaka**
Professor in Pali
BA (Hons); MPhil (USJ);
PhD (Zhejiang)
Email: duneshsjp@gmail.com
Office: 011-2758305



**Ven. Prof. Panahaduwe Yasassi**
Professor in Buddhist Civilization
BA (Hons) (USJ); MA (PGIPBS) (Kelaniya);
MA (BPU); PhD (USJ)
Email: venyasassi@sjp.ac.lk
Office: 011-2758307



**Ven. Dr. Kumbuke Chandraloka**
Senior Lecturer in Buddhist Philosophy
BA (Hons); MA (USJ);
PhD (Nalanda)
Email: chandalokak@gmail.com
Office: 011-2758305



**Ven. Kudakathnoruwe Vineetha**
Lecturer in Buddhist Philosophy
BA (Hons) (USJ); MA (Kelaniya)
MPhil (USJ)
Email: kathnoruwe@gmail.com
Office: 011-2758307



**Ven. Prof. Naimbala Dhammadassi**
Professor in Buddhist Philosophy
BA (Hons) (USJ); PhD (Lancaster)
Email: ndhmmadassi@gmail.com
Office: 011-2758305



**Ven. Prof. Medagampitiye Wijithadhamma**
Professor in Pali
BA (Hons); MA (Kelaniya);
PhD (Peradeniya)
Email: wijithadhamma@sjp.ac.lk
Office: 011-2758305



**Prof. K. A. Weerasena**
Professor in Buddhist Civilization
BA (Hons); MA (USJ);
PhD (BPU)
Email: s2554@sjp.ac.lk
Office: 011-2758320



**Prof. A. M. Nimal Wasantha Mendis**
Professor in Buddhist Civilization
BA (Hons); Mphil (USJ);
PGD in Archeology;
MSc (Kelaniya); PhD (Sichuan)
Email: wasantha_mendis@yahoo.com



**Mr. G. A. Gamini**
Professor in Buddhist Philosophy
BA (Hons) (USJ); MA (Kelaniya);
MPhil (Ruhuna), Phd (BPU)
Email: gaminimaneth@gmail.com
Office: 011-2758305



**Ven. Dr. Witharandeniye Chandasiri Thero**
Senior Lecturer in Pali
BA (Hons) (USJ); MA in Pali (PGIPBS) (Kelaniya); MA in Buddhist Studies (PGIPBS) (Kelaniya); Diploma in Education (Colombo); PhD (USJ)
Email: witharandeniyech@sjp.ac.lk
Office: 011-2758307



**Ven. Dr. Matibamiye Dhammasiri**
Lecturer in Buddhist Philosophy
BA (Hons) (USJ); MA (Kelaniya)
PhD (USJ)
Email: dhammasiri85@gmail.com
Office: 0112758307

## “දෙසවනට මිහිරක්” සුමධුර ජය පිරිත් දේශනය හා බෝධි පූජා වැඩසටහන

අධ්‍යනාංශයේ අංශාධිපති මහාචාර්ය එළමල්දෙණියේ සාරානන්ද හිමියන්ගේ අනුශාසකත්වයෙන් හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති ජ්‍යේෂ්ඨ මහාචාර්ය පද්මලාල් මානගේ මහතාගේ සහභාගීත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය බෞද්ධ අධ්‍යයන සංසදය විසින් “දෙසවනට මිහිරක්” යන තේමාව යටතේ නොයෙකුත් කරදර, බාධක හමුවෙහි නොසැලී ඉදිරියට යනු වස් සියලු සිසුන්ට සෙත් පතා සුමධුර ජය පිරිත් දේශනය හා බෝධි පූජා වැඩසටහනක් සැප්තැම්බර් මස 25 වන දින සවස 5.00ට විශ්වවිද්‍යාලීය බුදුමැදුර පරිශ්‍රය තුළ දී පවත්වන ලදී.









## ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියෝ විශේෂ දේශනයක් පවත්වන ලදි

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමි 2022/09/08 වන දින මියන්මාරයේ ක්‍යුන්හ්ලා බෞද්ධ විශ්වවිද්‍යාලයේ **“Introduction to Buddhist Literature”** යන මාතෘකාව යටතේ ආරාධිත දේශනයක් මාර්ගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදි.

## ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියෝ පාඨමාලා සමායෝජක ලෙස පත්වන ලදි

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියෝ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාවේ පාඨමාලා සමායෝජක වශයෙන් 2022 වර්ෂය සඳහා පත්කරන ලදි.

## ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියන් විසින් Research Dictionary Project (RDP) සඳහා සදාචාරය (Morality) නමින් ලිපියක් බාර දී ඇත

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමියන් විසින් පර්යේෂණ ශබ්දකෝෂ ව්‍යාපෘතිය සඳහා Research Dictionary Project (RDP) සඳහා සදාචාරය (Morality) නමින් ලිපියක් ලියා බාරදී ඇත. එම ලිපිය පහත දක්වා ඇත.

# සදාචාරය (Morality)

පෙරදිග දර්ශනය තුළ ආචාරධර්ම හෙවත් Ethics යන්න මුලින් භාවිතකර තිබෙන්නේ වෛදික දර්ශනයේ ය. බුදුදහමේ මෙම සංකල්පය විවරණයවන්නේ ඉන් පසුව ය. අපරදිග දර්ශනයේ මෙය මුලින්ම හමුවන්නේ ඇරිස්ටෝටල්ගේ ඉගැන්වීම් තුළ ය. ආචාරධර්මවල ප්‍රධාන අංශ දෙකකි. එනම්, සදාචාරය හෙවත් Morality යන්න හා දුරාචාරය හෙවත් Immorality යන්නයි. ඉංග්‍රීසි භාෂාවේ Morality යන්න පැරණි ලතින් භාෂාවේ Moralis යනුවෙන් දැක්වෙන අතර එය නූතන ලතින් භාෂවේ Moralitas යනුවෙන් දැක්වෙයි. පැරණි ප්‍රංශ භාෂාවේ එය දැක්වෙන්නේ Moralite යනුවෙනි. එය Moral යනුවෙන් පැරණි ඉංග්‍රීසියෙහි දැක්වෙන අතර නූතන මධ්‍ය ඉංග්‍රීසියෙහි එය දැක්වෙන්නේ Morality යනුවෙනි.

පර්යේෂණවලදී ආචාරධර්ම හා සදාචාරධර්ම සම්බන්ධයෙන් වර්තමානයේදී වඩාත් අවධානය යොමුකරනු ලැබේ. ආචාර යන්න හැසිරීම් අර්ථයෙහි ආ පූර්ව චර (ආ+√චර) ධාතුවෙන් නිර්මාණය වේ. සදාචාර යන්න නිර්මාණය වන්නේ ද හැසිරීම් අර්ථයෙහි √චර ධාතුවෙන් වුවද ඊට ප්‍රථම සද් යනුවෙන් උපසර්ග පදයක් එකතු වී තිබේ. එහි අර්ථය යහපත් යන්නයි. ඒ අනුව පර්යේෂණවලදී යහපත් ලෙස හැසිරිය යුතු බව හෙවත් යහපත් හැසිරීමක් සහිතව පර්යේෂණ කළ යුතු බව අවධාරණය කරයි. පර්යේෂණයක සදාචාරය අංශ කිහිපයක් පුරා විහිදීයයි. පර්යේෂකයින් පිළිබඳ සදාචාරය, පර්යේෂණ ආයතන සම්බන්ධ සදාචාරය, පර්යේෂණයට පිවිසීම සම්බන්ධ සදාචාරය, පර්යේෂණයේ අනුපිළිවෙල සම්බන්ධ සදාචාරය ආදී වශයෙනි.

පර්යේෂකයින් සම්බන්ධ සදාචාරය යටතේ පර්යේෂකයින් තමන් යොදාගන්නා දත්ත, සහ නිගමන සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු සැපයීමෙන් වැළකිය යුතු බවත් පර්යේෂණය සඳහා තෝරාගනු ලබන්නා වූ සේවාදායකයන්, පර්යේෂණ සංකල්ප, පර්යේෂණ ක්‍රියාමාර්ග, සහ පර්යේෂණයේ ප්‍රතිඵල ආදිය නොවළහා අනාවරණය කළ යුතු බවත් මෙහිදී අවධාරණය කෙරේ. විශේෂයෙන් තම පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ නොවන පර්යේෂණ කිරීමට යෑමෙන් සමාජයට වැරදි තොරතුරු අනාවරණය වීම වැළැක්වීම සඳහා ඉන් වැළකී සිටීමට නිහතමානී විය යුතුය.

## පර්යේෂණ ආයතන සම්බන්ධ සදාචාරය

පර්යේෂණ ආයතන මගින් පර්යේෂණ සිදුකිරීමේදී අදාළ ආයතන විසින් තම ආයතනයට අදාළ සදාචාර මූලධර්ම පද්දතියක් සකස් කරගෙන ඒවා තම ආයතනයේ පර්යේෂණ කාර්යයන්හි නියැලෙන පර්යේෂකයන්ට ලබාදිය හැකිය. එසේම ඒවා ආයතනය සමග සම්බන්ධ වන පර්යේෂකයන්ටත් එම පර්යේෂණවලට අනුග්‍රහය දක්වන ආයතනවලට ලබාදීමෙන් ඔවුන් ද අදාළ සදාචාර මූලධර්ම මත පිහිටා කටයුතු කිරීමට පොළඹවාගත හැකිය. උදාහරණයක් ලෙස මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පර්යේෂණ වලට වඩා වෙනස් කරුණු පිළිබඳව වෛද්‍ය විද්‍යාව සම්බන්ධ පර්යේෂණ වලදී සැලකිලිමත් විය හැකිය. එබැවින් ඒ ඒ ආයතන වලට වෙන වෙනම පර්යේෂණ සදාචාර මූලධර්ම සකස්කර ගන්නේ නම් වැදගත් වේ.

**පර්යේෂණයට පිවිසීම සම්බන්ධ සදාචාරය**

පර්යේෂණයට පිවිසීම සම්බන්ධ සදාචාරය පිළිබඳ අවධානය යොමුකිරීමේදී ඇතැම් පර්යේෂණ සිදු කිරීමේදී ඒවාට පිවිසීම සම්බන්ධ ගැටලු පිළිබඳ සාවධාන වීම සැලකේ. උදාහරණයක් වශයෙන් රෝගීන් සම්බන්ධයෙන් පර්යේෂණයක් කරන්නේ නම් එම රෝගීන්ගේ තොරතුරු පර්යේෂණය සඳහා යොදාගැනීමට ප්‍රථම අදාළ රෝගීන්ගෙන් අවසර ලබාගත යුතුය. වෘත්තිකයන් සම්බන්ධයෙන් වුවද වෙනත් ක්ෂේත්‍ර සම්බන්ධ පර්යේෂණ වලදී වුවද පර්යේෂණයට පිවිසීමට ප්‍රථම අදාළ අංශවලින් පර්යේෂකයා හෝ පර්යේෂණායතනය අවසර ලබාගත යුතුව තිබේ.

**පර්යේෂණයේ අනුපිළිවෙල සම්බන්ධ සදාචාරය යනු**

පර්යේෂණයේ මූලික අනුපිළිවෙළ වනුයේ ගැටලුව හඳුනාගැනීම, පර්යේෂණය සැලසුම් කිරීම, පර්යේෂණය ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල අනාවරණය කිරීම යන අනුපිළිවෙල පිළිබඳ යහපත් හැසිරීමයි. ගැටලුව මුලින්ම හඳුනාගැනීමට පාදක වූ න්‍යාය සොයාගත් පර්යේෂකයන්ට එහි ගෞරවය ලැබෙන පරිදි තම පර්යේෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ගැටලුව හඳුනාගැනීමේ සදාචාරය යි. පර්යේෂණ සැලසුම්කිරීමේදී සාහිත්‍ය විමර්ශය ආදී තොරතුරු ඉදිරිපත් කිරීමේදී මුල්ම කෘතිය සොයාගැනීම වැදගත් වේ. එසේ නොමැතිව ද්වීතීයික මූලාශ්‍රය භාවිත කිරීමත් එය භාවිත කරමින් මුල් කෘතිය භවිත කළ බව හැඟවීමත් සදාචාර විරෝධී වේ. පර්යේෂණයේ නියැදිය, දත්ත රැස්කිරීම, විශ්ලේෂණය අදිය සිදුකළ යුත්තේ තම අරමුණ තහවුරු කිරීමට නොවේ. සැබෑ ලෙසම දත්ත වලින් අනාවරණය වන ආකාරයට ප්‍රතිඵල අනාවරණය කිරීම සිදුකිරීම පර්යේෂකයාගේ කාර්යභාර්ය වන අතර එසේ නොවන්නේ නම් එය සදාචාර විරෝධී වේ.

පර්යේෂණ සම්බන්ධ පොදු සදාචාර නියමයන් කිහිපයක් ඉහතින් දැක්වීමු. එයට අමතරව වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණවලට වෙනම ආචාරධර්ම පද්දතියක් ද සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පර්යේෂණ සඳහා වෙනම ආචාර ධර්ම පද්දතියක් ද තිබෙන බව අන්තර්ජාලයේ සඳහන්වේ. ඇමරිකානු සමාජවිද්‍යා සංගමය මගින් සමාජවිද්‍යාත්මක පර්යේෂණ සඳහා සදාචාරධර්ම පහක් හඳුන්වාදී තිබේ. එනම්,

**01. වෘත්තීය නිපුණතාව**

යම්කිසි වෘත්තීයක නියැලීම සඳහා වෘත්තීය නිපුණතාව අවශ්‍ය බව ඔවුහු පිළිගනිති. ඒ සඳහා ඔවුන් තමන්ගේ වෘත්තීයට අදාළ සීමාවන් හඳුනාගෙන ඒ සඳහා අඛණ්ඩව අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් එකතු කරගෙන අදාළ පර්යේෂණ වල නියැලෙති.

**02. අඛණ්ඩතාව**

සමාජවිද්‍යාඥයියෝ බොරුකිරීම්, නොමගයැවීම් රැවටිලි ආදිය නොකරති. ඔවුහු අවංක, සාධාරණ හා ගෞරවනීය අයුරින් තම සේවය අන් අයගේ සුභසිද්ධිය උදෙසා ලබාදෙන අතර ඔවුන්ගේ සුභසිද්ධිය විනාශ නොවන ආකාරයට දිගටම කටයුතුකිරීමට වගබලා ගනිති.

**03. වෘත්තීය හා විද්‍යාත්මක වගකීම**

සමාජ විද්‍යාඥයින් හැමවිටම තව වෘත්තිය පිළිබඳ වගවන අතර තම වෘත්තිය සම්බන්ධයෙන් මහජන විස්වාසය කඩවන අයුරින් කටයුතු නොකරයි.

**04. ජනතා අයිතිවාසිකම්**

සමාජය තුළ විවිධ ජනවර්ග, විවිධ ආගමිකයන්, විවිධ සංස්කෘතීන්, විවිධ අධ්‍යාපන මට්ටම් සහිත අය සහ විවිධ ආබාධ සහිත අයවලුන් ජීවත් වෙති. උක්ත සියලු කොටස් වලට ඔවුන්ට ආවේණික ලක්ෂණ පවතී. එකී සියලු වෙනස්කම් වල වටිනාකම් හඳුනාගෙන ක්‍රියාකිරීම සමාජවිද්‍යාඥයන්ගේ වගකීම වේ.

**05. සමාජ වගකීම**

පර්යේෂණ සිදුකරන විට තම විෂය දියුණුකිරීම සඳහා මෙන්ම මහජන සේවය උදෙසා හෙවත් යහපත උදෙසා කටයුතුකිරීමට තම දැනුම ලබාදීම සමාජ විද්‍යාඥයින්ගේ අරමුණ වේ.

පර්යේෂණයක් සිදුකිරීමේදී සදාචාර සංකල්පය කෙතරම් වැදගත් වන්නේ ද යන්න ඉහත සඳහන් තොරතුරු වලින් අනාවරණය කරගත හැකිය. සදාචර සංකල්පය පර්යේෂණය ආරම්භයේ පටන් අවසන් වන තුරුත් අවසන් වීමෙන් පසුත් වැදගත් වන බව උක්ත තොරතුරු වලින් පැහැදිලි වේ. සදාචාරයෙන් තොර පර්යේෂණය ඇතැම්විට කරුණු අතින් සාර්ථක විය හැකිය. එහෙත් සමාජයේ අන් අයගේ ජීවිතවලටත් බුද්ධිමය දේපලවලටත් හානියක් වන්නේ නම් එවැනි පර්යේෂණය සාර්ථක වූද ගුණාත්මක වූද පර්යේෂණයක් ලෙස නිර්වචනය කළ නොහැකි බැවින් සදාචාරයත් සමග සිදුකරන පර්යේෂණය ම ගුණාත්මක මෙන්ම සාර්ථක පර්යේෂණයක් ලෙස සැලකිය හැකි බව මෙහිදී අවධාරණය කළ යුතුය.

**වැඩිදුර කියවීම්**


- කොඩිතුවක්කු, ගොඩ්වින්, පර්යේෂණ ආචාරධර්ම, 2017, පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බත්තරමුල්ල.
- ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, 2011, විජයතුංග, හරිස්චන්ද්‍ර, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
- පාලි සිංහල ශබ්දකෝෂය, 1965, සුමංගල හිමි, මඩිතියවෙල, ලන්ඩන්.
- https://si.eferrit.com/%E0%B7%83%E0%B6%B8%E0%B7%8F%E0%B6%A2-%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A%E0%B6%BA%E0%B7%8F%E0%B6%AD%E0%B7%8A%E0%B6%B8%E0%B6%9A/
- https://www.google.com/search?q=english+dictionary&oq=English+dic&aqs=chrome.0.0i433i512j69i57j0i512l8.6574j0j15&sourceid=chrome&ie=UTF-8#dobs=morality



ආචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි හිමි

(B.A. (Hons), M.A., Ph.D., Dip. in Education, Royal Pundit)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල, නුගේගොඩ.